# වලස් පැංචයි

# හා පැංචයි



තේජිනි දශ්මි යාපා බණ්ඩාර

# වලස් පැංචයි හා පැංචයි.

**තේජිනි දශ්මි  යාපා බණ්ඩාර**

චිත්‍ර :  තේජිනි දශ්මි  යාපා බණ්ඩාර

**ISBN-978-624-206-742-1**

**ප්‍රථම මුද්‍රණය. : 2023.11.15**

# පිදුම

මා හට ශක්තියක් වූ

අම්මාටත් තාත්තාටත්

මා හට අකුරු කියා දුන් ආදරණීය වාසනා ගුරුතුමියටත්

මෙම පොත් පිංච උපහාරයක් ම

වේවා.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු. සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුලින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමයකරගත් මහාමායා දියණියන් වසර ගනනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහනයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් ''දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමී.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යයාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය- මහනුවර

2023.11.01

එකෝමත් එක කාලෙක වලස් පැංචෙකුයි හා පැංචෙකුයි හිටියා.

හා පැංචා රෝස පාටයි වලස් පැංචා දුඹුරු පාටයි.



මේ දෙන්නා දවසක් කැලෑවේ ඇවිදින්න ගියා.

ඒගොල්ලෝ ටික දුරක් යද්දී බඩගින්නකුත් ආවා.




ඉතින් මේ දෙන්නම කෑම හොයා ගන්න හිතුවා.

වලස් පැංචා කන්න කැමති මී පැණි. හා පැංචට ඕන වුණේ කැරට් අලයක් කන්න.




ඔන්න ටික දුරක් යද්දී වලස් පැංචා ගහක් උඩ මී වදයක් තියෙනවා දැක්කා. ඉතින් එයා ගහට නැගලා මී පැණි බඩ පිරෙනකම් ම කෑවා.



දැන් ඉතින් හා පැංචට කන්න කැරට් අලයක් හොයා ගන්න ඕන. ටිකක් දුර යද්දී හා පැංචා කැරට් වත්තක්ම දැක්කා. එයා ඉතින් ඒකෙන් අලයක් අරගෙන බඩ පිරෙනකම් ම කෑවා.



ඒ දෙන්නාටම හොඳටම තිබහයි. ඉතින් මේ දෙන්නා වතුර හොයාගෙන යනකොට පුංචි පොකුණක් හම්බ වුණා. දෙන්නම සතුටින් වතුර බිව්වා.



දැන් දෙන්නාටම හොඳටම නිදිමතයි. ඒගොල්ලෝ ගහක් යට ටිකක් වෙලා නිදා ගත්තා.



හදිසියේම දෙන්නටම ඇහැරුණා. ඉතින් හා පැංචයි වලස් පැංචයි ගෙදර යන්න පිටත් වුණා.



ගෙදර එනකොට හොඳටම කළුවර වෙලා. දෙන්නම ඉටිපන්දමක් පත්තු කරලා රෑ කෑම ගත්තා.



දෙන්නාටම හොඳටෝම මහන්සියි. ඉතින් වලස් පැංචයි හා පැංචයි දත් මැදලා මුහුණ සෝදලා ඇඳට ගිහින් නිදාගත්තා..



# <u>පසුවදන</u>



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස් වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත් කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්ම දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන්, ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශණය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්තකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක.

2023.11.01